**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No: HRC/3704/23

ඔබේ අංකය / உமது இல. / Your No:

දිනය / திகதி / Date: 2024-03-11

පැමිණිලි පාර්ශවය : පූජ්‍ය තිනියාවල පාලිත හිමි,
විහාරාධිපති,
නුගේගොඩ නාලන්දාරාමය,
නො - 29/160, ඩී.එම් කොළඹගේ මාවත,
කොළඹ 05

වගඋත්තරකරුවන් :

01. ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

02. ලේකම්,
බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
8 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

03. බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්,
බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව,
නො - 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

04. ජනාධිපති ලේකම්,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

05. අග්‍රාමාත්‍ය ලේකම්,
අග්‍රාමාත්‍ය කාර්යාලය,
අංක 58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 07.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්.ඒ.ද මෙල් මාවත, කොළඹ-04. / இல.14, ஆர்.ஏ.டி.மெல் மாவத்தை, கொழும்பு-04. / No.14, R.A. De Mel Mawatha, Colombo-04.
සභාපති / தவிசாளர் / Chaiman: 011-2505551
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / Email: sechrcsl@gmail.com
දුරකථන
ලේකම්
ක්ෂණික
වෙබ්

**පැමිණිලි අංකය : HRC/3704/23**

**පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම :-**

පැමිණිලිකාර ස්වාමීන් වහන්සේ විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින්, තමන් වහන්සේ සාමාජිකත්වය දරණ කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමාග්‍රීධර්ම මහා සංඝ සභාව සම්බන්ධයෙන් පවතින ඉල්ලීම් කිහිපයක් සම්බන්ධයෙන් සඳහන් කර ඇත. කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමාග්‍රීධර්ම මහා සංඝ සභාව වසර 168ක ඉතිහාසයක් ඇති රජය විසින් පිළිගත් ස්වාධීන සංඝ සභාවක් බවත්, එය සියම් නිකායට අයත් පාර්ශවයක් ලෙස ඇතැමුන් නම් කළද ආරම්භයේ සිට මේ දක්වා සංඝ සභාව ක්‍රියාත්මක වී ඇත්තේ අනෙකුත් නිකායන්ගෙන් සහ පාර්ශවයන්ගෙන් වෙන් වූ සංඝ සභාවක් ලෙස බවත්, කෙසේ වෙතත් සියම් නිකායේ පාර්ශව දෙකක් ලෙස සැලකෙන අස්ගිරි හා මල්වතු පාර්ශවයන්ට රජය මගින් ලබා දෙන වරප්‍රසාද, ප්‍රතිලාභ සහ පිළිගැනීම ස්වාධීන සංඝ සභාවක් වන කෝට්ටේ සංඝ සභාවට නොලැබෙන බවත් පැමිණිල්ලෙන් සඳහන් කර ඇත. ඒ අනුව පැමිණිලිකාර පාර්ශවය ඉල්ලා සිටින්නේ සියලු කරුණු සමාලෝචනය කර විධිමත් පරීක්ෂණයක් පවත්වා නිරවුල් යහපත් තීන්දුවක් ලබා දෙමින් මානව හිමිකම් සුරක්ෂිත කර දෙන ලෙසයි.

කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමාග්‍රී ධර්ම මහා සංඝ සභාවේ ප්‍රධාන ලේඛකාධිකාරී කොටපිටියේ රාහුල අනුනායක මහා ස්ථවිර විසින් ඉදිරිපත් කර ඇති 2023.10.09 දිනැති කරුණු දැක්වීම මඟින් මෙරට කටයුතුවලදී කෝට්ටේ සංඝ සභාව මුහුණදෙන ගැටළුකාරී තත්ත්වයන් දක්වා ඇත.

18 සියවසේ මැදභාගයේදී උපසම්පදා භික්ෂූහු ලංකාවේ නොසිටි අවධියක 1753 දී වැලිවිට සරණංකර හිමි විසින් සියමෙන් උපසම්පදා භික්ෂූහු මෙරටට වැඩමකරවාගෙන ලාංකීය භික්ෂූන් උපසම්පදා කරන ලද බවත්, ඒ අනුව දිවයිනේ විවිධ දිශාවල වාසය කළ උපසම්පදා වීමට කැමැති හිමිවරුන් මහනුවර අස්ගිරි හා පෝයමළු විහාරවල විසූ සංඝයාට පවරනු ලැබ ඇති බවත් දක්වයි. 1826-1835 කාලයේ අස්ගිරි මහාවිහාරයේ මහානායක ධූරය හෙබවූ යටන්වල සිරි සුනන්ද හිමිපාණන් වහන්සේ විසින්, "අසීමාවේ පවා උපසම්පදා කළාට වරදක් නැතැ"යි කරන ලද ප්‍රකාශයට මල්වතු මහාවිහාරයේ මහනායක හිමි ඇතුළු භික්ෂූන් වහන්සේලා විරුද්ධ වීම හේතුවෙන් ඇති වූ තත්වයේ ප්‍රතිඵලයක් ලෙස ඇතැම් භික්ෂූන් අස්ගිරි-මල්වතු විහාරවලින් ලද උපසම්පදාව පිළිබඳ සැකකර උපසම්පදාව සඳහා භික්ෂූන් මල්වතු-අස්ගිරි විහාරවලට ඉදිරිපත් කර නොමැති බවත්, එහිදී ගණනායක බෙන්තර අස්ථදස්සි හිමියන් මෙම ක්‍රමය සංශෝධනය කිරීමේ අදහසින් වසර 20 කට වැඩි කාලයක් කටයුතු කර ඇති බවත් දක්වයි. එසේම පවතින ලේඛන වල දක්වා ඇති පරිදි 1833-1841 කාලය දක්වා මධ්‍යම පළාතේ ඒජන්ත ධූරය දැරූ

ජෝර්ජ් ටර්නර් මහතා රාජ්‍ය මට්ටමින් උන්වහන්සේව මහනුවරට ගෙන්වා ගැනීමට කටයුතු කර ඇති බවද ලේඛන අනුව දැක්වෙන බව සඳහන් කර ඇත.

මෙවැනි පසුබිමක් තුළ බෙන්තර අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේ ද කොළඹ නව කෝරළයේ ප්‍රධාන නායක ධූරයට පත්කරන ලදුව මහත් කීර්ති ඇතිව පහත රට සංඝයාට නායකව වැඩ සිටි කෝට්ටේ රජමහ විහාරාධිපති මලිගස්පේ ධර්මකීර්ති ශ්‍රී මංගලාභිදාන නායක ස්වාමීන් වහන්සේද, පානදුර අරුග්ගොඩ ඉන්දසරරාමාධිපති පානදුරේ සුමංගල මාහිමි, පානදුර ගල්ගොඩ ශ්‍රී මහා විහාරාධිපති පැපිලියානේ සීලවංශ මාහිමි, රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙණේ අධිපති වූ වලානේ සිද්ධාර්ථ මාහිමි යන තෙරවරුන් සමඟ එක්ව පහතරට උපසම්පදාව ඇතිකිරීමෙහි ලා උත්සුක වී ඇති බවට දැක්වේ. 1855 දී ඉහත කී ස්වාමීන් වහන්සේලා කෝට්ටේ කල්‍යාණි සාමාග්‍රීධර්ම නමින් සංඝ සභාවක් පිහිටුවා ගෙන ඇති අතර, එම සංඝ සභාවේ උපසම්පදා විනයකර්මය කැළණි ගඟෙහි උදකුක්ඛේප සීමාවක සිදුකිරීමට තීරණය කර ඇති බවත්, පසුව එහිදී ඇති වන ගැටළු කෙරෙහි සලකා බලා කෝට්ටේ රාජමහා විහාරස්ථ පෞරාණික බද්ධ සීමාවේදී උපසම්පදා විනය කර්මය සිදුකිරීමට තීරණය කර ඇති බවත්, මේ වන විට කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහා සංඝසභාව නමින් ක්‍රියාත්මක වන්නේ එසේ ඇති වූ සංඝසභාව වන බවත් දක්වයි. මෙම සංඝ සභාව 1854 වර්ෂයේ ආරම්භ කළ ඉපැරණි සංඝසභාවක් වන අතර, ඇතැම් නිකායන්ට වඩා ඉපැරණි වන බවත්, ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම සංඝ සභාව ශ්‍රී ලංකාවේ ජාතික ආගමික සංස්කෘතික හා අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි කැපී පෙනෙන යතිවරයාණන් වහන්සේලාගේ එනම්, වලානේ සිද්ධාර්ථ නාහිමි, හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි, රත්මලානේ ශ්‍රී ධම්මාරාම මාහිමි යන ස්වාමීන්ද්‍රයන් වහන්සේලාගේ දායකත්වයෙන් කටයුතු කර ඇති බවත්, එසේම මෙම සංඝ සභාව ජයවර්ධනපුර කොට්ටේ අගනුවර පිහිටා ඇති එකම සංඝ මූලස්ථානය වන අතර, සංඝසභාව ආරම්භයේ සිට පැවතුනු රාජ්‍යයන් කෝට්ටේ සංඝසභාව ඉහළින් පිළිගෙන තිබුණු බවත් දක්වයි. මේ අනුව, 1980 වසරේදී පැවැත්වූ මහානායක පදවියේ අක්තපත්‍ර ප්‍රදානෝත්සවයේදී කෝට්ටේ සංඝසභාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ප්‍රධාන උපදේශක සංඝ සභාව වශයෙන් සැලකීමේ අවශ්‍යතාවය ජනාධිපති ජේ.ආර් ජයවර්ධන මැතිතුමා විසින් පෙන්වා දී ඇති බවත්, නිල බලයෙන්ම ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමා සහ කථානායකතුමා කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රිධර්ම සංඝසභාවේ භාරකාර දායකයන් බවට පත්වන බවත් දක්වා ඇත.

මේ අනුව,

- කෝට්ටේ සංඝ සභාව ස්වාධීන සංඝ සභාවක් ලෙස ක්‍රියාත්මක වුවත් බුද්ධශාසන අමාත්‍යාංශය, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය රාජ්‍ය කටයුතුවලදී සියම් නිකායේ අස්ගිරි හා මල්වතු පාර්ශවවල මහනාහිමිවරුන් දෙදෙනාගේ මතය පමණක් සියම් නිකාය වෙනුවෙන් විමසනු ලබන බවත්,

- බුද්ධශාසනය පිළිබඳ අනුශාසක මණ්ඩල පත්කිරීමේදී කෝට්ටේ සංඝ සභාවට කිසිදු නියෝජනයක් නොලැබෙන බවත්,

- රාජ්‍ය උත්සව වලදී ආසන පැනවීමේදී හා අනුශාසනවලදී කෝට්ටේ සංඝ සභාවේ මහනාහිමියන්ට අවස්ථාවක් ලබා නොදෙන බවත්, කෝට්ටේ සංඝ සභාවේ මහනාහිමියන්ට වඩා අඩු සුදුසුකම් සහිත වයසින් අඩු අනුනාහිමිවරුන්ට මූලිකත්වය දී කටයුතු කරනු ලබන බවත්,

- කෝට්ටේ සංඝ සභාවේ මහනායක අක්තපත්‍ර උත්සව හා ආදාහන පූජෝත්සව ඇතැම් රාජ්‍ය පාලන කාලවල රාජ්‍ය ගෞරව සහිතව සිදුකෙරෙන අතර, ඇතැම් කාලවල එසේ අනුග්‍රහය දක්වනු නොලබන බවත්,

- රජය මඟින් නිකාය මූලස්ථාන සඳහා ලබාදෙන මූල්‍ය ප්‍රතිපාදන ඉතා කලාතුරකින් පමණක් කෝට්ටේ සංඝ සභාව වෙත ලබා දෙන බවත්,

- විදෙස් සංචාර ආදියට රාජ්‍ය නියෝජන නම් කිරීමේදී කෝට්ටේ සංඝ සභාවට කිසිදු අවස්ථාවක් නොලැබෙන බවත්,

- අතිපූජ්‍ය මහනායක මාහිමිපාණන් වහන්සේලා වෙත රජය මඟින් ලබාදෙන ඉන්ධන දීමනා, තීරුබදු රහිත වාහන, ආරක්ෂක පහසුකම් හා සෞඛ්‍ය පහසුකම් කෝට්ටේ සංඝ සභාවේ මහනායක මාහිමිපාණන් වහන්සේට හිමි නොවන බවත්,

- සංඝ සභාවේ කාර්යාලය නඩත්තු කිරීම සඳහා රජය විසින් අනෙකුත් සංඝ සභා සඳහා ලබාදෙනු ලබන ස්ථිර ලිපිකරුවන් හා සුළු සේවකයන් කෝට්ටේ සංඝ සභාව වෙත ලබා දී නොමැති බවත් දක්වා ඇත.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

**ජනාධිපති ලේකම්**

ජනාධිපති ලේකම් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ලේකම් වෙත යොමු කරන ලද අංක PS/LAD/1/66 හා 2023.10.02 දිනැති වාර්තාව අනුව, මෙම ගැටලුව මෙරට බුදු සසුනේ නිකාය හා පාර්ශව සඳහා හිමි වී ඇති පිළිගැනීම සම්බන්ධ කරුණක් වන බැවින් එය ත්‍රෛනිකායික මහනායක හිමිවරුන් සමඟ සාකච්ඡා කර එම මහ නාහිමිවරුන්ගේ එකඟතාවයෙන් තීරණය කළ යුතු කරුණක් බවට දක්වා ඇත.

**බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් - බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව**

බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ලේකම් වෙත යොමු කරන ලද අංක බෞකො/පා/01/මා.හි.කො.ස/3704/23 හා 2023.09.26 දිනැති වාර්තාව අනුව, කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව ද බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් පිළිගනු ලබන නිකාය පාර්ශව 31 අතර සමානව පිළිගනු ලබන නිකාය පාර්ශවයක් බවත්, 1931 අංක 19

දරණ විහාර දේවාලගම් ආඥා පනත අනුව විධිමත් හා නීත්‍යානුකූල ලෙස පිළිගන්නා ලද නිකාය පාර්ශවයන් වෙත කරනු ලබන සමාන පිළිගැනීම් පනතේ විධිවිධාන යටතේ කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව වෙත ද ලබා දෙන බවද සඳහන් වේ.

**ලේකම්, බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති වෙත යොමු කරන ලද අංක MBRCA/07/බෞද්ධ/වෙනත් හා 2023.09.27 දිනැති වාර්තාව අනුව බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරන සියලු ජාතික උත්සව හා අනෙකුත් ජාතික වැඩසටහන්වලදී සියලු නිකාය පාර්ශවවල අතිපූජ්‍ය මහනායක හිමිවරුන්ට ආරාධනා කිරීම සිදුකරන අතර, ඒ අනුව අමාත්‍යාංශය හා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් රාජකාරී කටයුතු සිදුකිරීමේදී සියලු නිකාය පාර්ශවයන් සඳහා සමාන පිළිගැනීමක් ලබාදෙයි.

මෙම පැමිණිල්ල සම්බන්ධව 2023.10.24 දින දෙපාර්ශවයේ සහභාගීත්වයෙන් යුතුව පරීක්ෂණ කටයුතු සිදුකරන ලදී. එහිදී ඉදිරිපත් වූ කරුණු සහ පරීක්ෂණයෙන් අනතුරුව ඉදිරිපත් කරන ලද ලිඛිත කරුණු දැක්වීම් පහත පරිදි වේ.

**බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව**

ජාතික උත්සව අවස්ථාවලදී ආසන පැනවීමේ දී පවතින අසමානතා සම්බන්ධව සඳහන් කරනු ලබන්නේ, ජාතික උත්සව අවස්ථාවලදී මහනායක ස්වාමීන් වහන්සේලා, අනුනායක ස්වාමීන් වහන්සේලා, සංඝනායක ස්වාමීන් වහන්සේලා, විහාරාධිපති ස්වාමීන් වහන්සේලා ලෙස පිළිවෙලින් අසුන් පැනවීම සිදුකරන බවත් සෙසු භික්ෂූන් වහන්සේලා සඳහා වෙන්කර ඇති ආසන සහ මහළු පිළිවෙළ අනුව වඩා හිඳුවීම සිදුකරනු ලබන බවයි. මෙහිදී භික්ෂූන් වහන්සේලා සඳහා වෙනම ම සකසා ගත් ප්‍රමුඛතා ලේඛනයක් නොමැති අතර ශාසනික සම්ප්‍රදාය අනුව එලෙස නිශ්චිත ලේඛනයක් සැකසීම ද ප්‍රායෝගිකව අපහසු වේ.

විශ්වවිද්‍යාල මහෝපාධ්‍යා පදවි, පිරිවෙන් මණ්ඩල සහ ජනාධිපති උපදේශක මණ්ඩල සඳහා පත් කිරීමේදී සාධාරණ නියෝජනයක් සිදු නොවීම සම්බන්ධව සඳහන් කරනු ලබන්නේ, මෙම පදවි සඳහා පත් කිරීම බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් සිදු නොකරන බවත්, අවස්ථානුකූලව ගරු ජනාධිපතිතුමා, අමාත්‍ය මණ්ඩලය හා අදාළ විෂයභාර අමාත්‍යාංශය මගින් පත්කිරීම සිදුකරන බවත්, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් ශාසනික වශයෙන් වැදගත් කරුණු සාකච්ඡා කිරීම හා උපදෙස් ලබා ගැනීම සඳහා වන කමිටු හා මණ්ඩලවලදී කිසිදු නිකාය පාර්ශව භේදයකින් තොරව ස්වාමීන් වහන්සේලාගේ බහුශ්‍රැතභාවය සලකා පත්කිරීම් හා උපදෙස් ලබා ගැනීම් සිදුකරනු ලබන බවත් ය.

නිකාය සඳහා රජයෙන් ලබාදෙන වරප්‍රසාද සහ පහසුකම් සමානව නොලැබීම සම්බන්ධව සඳහන් කරනු ලබන්නේ, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව වෙත වෙන් වන ප්‍රතිපාදන අතර නිකාය මූලස්ථාන සඳහා වාර්ෂිකව රු.240,000 ක රාජ්‍ය ප්‍රතිපාදන ලබාදීම සිදුකරනු ලබන බවත්, මේ සඳහා අවම වශයෙන් විහාරස්ථාන 600 කට වඩා ඇති නිකාය මූලස්ථාන තෝරා ගනු ලබන බවත්, ඒ අනුව දැනට මෙම දීමනාව ලබා දෙන නිකාය මූලස්ථාන පහක් ඇති බවත් ය.

- ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශවය
- ස්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශවය
- ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව
- ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාව
- ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය

මීට අමතරව සෑම නිකාය හා පාර්ශවයකම නවක උපසම්පදාලාභී ස්වාමීන්වහන්සේලාගේ උපසම්පදා උත්සව සඳහා සහභාගී වන උපසම්පදාලාභී ස්වාමීන්වහන්සේලා වෙනුවෙන් රු.3000.00 බැගින් වන පරිදි ගමන් වියදම් දීමනාවක් ගෙවනු ලබන බවත්, ඒ ඒ නිකාය හා පාර්ශව වල ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා විසින් එවනු ලබන ලේඛන අනුව මෙම ගෙවීම් කටයුතු සිදු කරන අතර ඉල්ලීම් සිදුකර ඇති සියලු නිකාය පාර්ශව වෙත කිසිදු වෙනස්කමකින් තොරව ගෙවීම් කටයුතු සිදුකරනු ලබන බවත් දක්වයි.

රාජ්‍ය අනුග්‍රහය ලබාදීමේදී සිදුවන අසමානතා සම්බන්ධව සඳහන් කරනු ලබන්නේ, මහනායක ස්වාමීන් වහන්සේලාගේ අක්තපත්‍ර ප්‍රධානෝත්සව සහ ආදාහන පූජෝත්සව සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දීම අතිගරු ජනාධිපතිතුමාගේ හා අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි සිදුකරනු ලබන බවත්, ගරු ජනාධිපතිතුමා විසින් අනුග්‍රහය දැක්විය යුතු යැයි තීරණය කරනු ලබන නායක ස්වාමීන් වහන්සේලා සඳහා පවත්වනු ලබන රාජ්‍ය උත්සව හා ආදාහන උත්සවවලදී බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සහයෝගය ලබා දෙන බවත්, මෙම උත්සව සංවිධානය කිරීම ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා ඒකාබද්ධව ඒ ඒ දිසාපතිවරුන්ගේ සංවිධානයෙන් සිදුකරනු ලබන බවත් ය.

කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව සෙසු නිකාය පාර්ශවයන්ගෙන් වෙන් වූ වෙනම ඒකකයක් ලෙස පිළිගැනීම ශාසනික වශයෙන් ගත යුතු තීරණයක් වන බවත්, අනෙකුත් සියලු මහා නායක ස්වාමීන් වහන්සේලාගේ එකඟතාවය මත සිදු කළ යුතු කරුණක් බවත්, ඒ අනුව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවට මැදිහත් වීමේ හැකියාවක් නොමැති බවත් දක්වා ඇත.

**අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය**

පැමිණිලි පාර්ශවය ඉදිරිපත් කර ඇති කාරණා සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය කාර්යාලය සෘජු මැදිහත්වීමක් සිදු නොකරන බවත්, රජය විසින් ගන්නා තීරණ අනුව අවස්ථානුකූලව පහසුකම් සැලසීම පමණක් සිදුකරන බවත්, එසේ පහසුකම් සපයන සෑම අවස්ථාවකදීම ජනාධිපති ලේකම් කාර්යාලයේ උපදෙස් හා බුද්ධ ශාසන විෂය භාර අමාත්‍යාංශයේ දැනුම මත පිහිටා කටයුතු කරන බවත් දක්වයි.

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

අමාත්‍යාංශය මඟින් රාජ්‍ය උත්සව හා රාජ්‍ය අනුග්‍රහයෙන් පැවැත්වෙන ආදාහන උත්සව සඳහා සහභාගී වන පූජ්‍ය පක්ෂය වෙනුවෙන් පැනවෙන ආසන සංඛ්‍යාවට අදාළ ආසන සැලැස්ම පමණක් සකස් කරන බවත්, පූජ්‍ය පක්ෂයට ආසන පැනවීම හා ආසන පැනවීමේ පිළිවෙල බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව හරහා සිදුවන බවත්, පූජ්‍ය පක්ෂය සඳහා වන ජනරජ ප්‍රමුඛතා ලේඛනයක් අමාත්‍යාංශය මගින් නඩත්තු නොවන බවත්, ජනරජ ප්‍රමුඛතා ලේඛනය සකස් කිරීම ජනාධිපති ලේකම් කාර්යාලය මගින් සිදු කරන බවත්, අමාත්‍යාංශය මගින් එම නිලධාරීන්ගේ නාමාවලිය යාවත්කාලීන කිරීම පමණක් සිදුකරන බවත් සඳහන් කර ඇත.

**කොටපිටියේ රාහුල අනුනාහිමි විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත කරුණු දැක්වීම අනුව,**

2023.10.24 දින පැවති පරීක්ෂණයෙන් අනතුරුව අග්‍රාමාත්‍ය කාර්යාලය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති වාර්තාවල සඳහන් කරුණු සම්බන්ධව එකඟ විය හැකි බවත්,

බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් යොමු කර ඇති වාර්තාවේ සඳහන් කරුණු ප්‍රතික්ෂේප කරන බවත් ඒ අනුව දැනට විශේෂිත පාර්ශව වෙනුවෙන් ලබාදෙන සියලු වරප්‍රසාද හා පිළිගැනීම ලේඛනයක් ඉදිරිපත් කිරීම හා එහි අඩංගු වරප්‍රසාද හා පහසුකම් කෝට්ටේ සංඝ සභාවට ද ලබා දෙනවාද නැද්ද යන්න ප්‍රකාශ කිරීම සිදුකළ යුතු බවත් සඳහන් කර ඇත.

ප්‍රධාන නිකායවලට හා පාර්ශවවලට ලබාදෙන මුදල් කෝට්ටේ සංඝ සභාවට හිමිවී නොමැති බවත්, පසුගිය මාස 6 තුළ එවැනි මුදලක් තමාට හිමි නොවූ බවත්, 2023.10.24 දින කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයෙන් අනතුරුව අදාළ මුදල් ලබාදීමට කටයුතු කළ බවත් වැඩිදුරටත් දක්වා ඇත.

**නිරීක්ෂණ :-**

රජය විසින් සියම් නිකායේ මල්වතු, අස්ගිරි පාර්ශවවලට ලබා දෙන වරප්‍රසාද කෝට්ටේ සංඝ සභාවට හිමි නොවීම සම්බන්ධව මෙම පැමිණිල්ල යොමු කර ඇත.

සියම් නිකායේ පාර්ශව වන මල්වතු හා අස්ගිරි පාර්ශවවලට ලබාදෙන සියලු වරප්‍රසාද කෝට්ටේ සංඝ සභාවට ද ලබාදෙන බවට බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් කරුණු දක්වා ඇතත්, එලෙස සියලු වරප්‍රසාද හිමි නොවන බවට කොටපිටියේ රාහුල අනුනාහිමි විසින් ඉදිරිපත් කර ඇති පහත සඳහන් කර ඇති කරුණු අනුව නිරීක්ෂණය වේ.

1. රාජ්‍ය කටයුතුවලදී සියම් නිකායේ අස්ගිරි හා මල්වතු පාර්ශවවල මහනාහිමිවරුන් දෙදෙනාගේ හා රාමඤ්ඤ, අමරපුර නිකායේ මහනාහිමිවරුන්ගේ මතය පමණක් විමසනු ලබන බව හා කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහා සංඝ සභාවේ අදහස් නොවිමසන බව,

2. බුද්ධශාසනය පිළිබඳ අනුශාසක මණ්ඩල පත්කිරීමේදී කෝට්ටේ සංඝ සභාවට කිසිදු නියෝජනයක් ලබා නොලැබෙන බවත්, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය හා අනුරාධපුර ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය යන ආයතන දෙකෙහි මහමහෝපාධ්‍යාය ධූරය පෙර සියම්, අමරපුර, රාමඤ්ඤ යන නිකාය තුනෙහි මහානායක මාහිමිපාණන් වහන්සේලා සිව් නමට පමණක් තට්ටු මාරු ක්‍රමයට හිමිවුවද කෝට්ටේ සංඝසභාවේ මහානායක මාහිමිපාණන් වහන්සේ එයින් ඉවත් කර තිබීම ඊට නිදසුනක් බවත් දැක්වේ. පිරිවෙන් මණ්ඩලය, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම ආදී ආයතනවලට කෝට්ටේ සංඝ සභාවේ නියෝජනයක් නොලැබෙන බව,

3. රාජ්‍ය උත්සවවලදී ආසන පැනවීමේදී හා අනුශාසනවලදී කෝට්ටේ සංඝ සභාවේ මහනාහිමියන්ට අවස්ථාවක් ලබා නොදෙන බවත්, කෝට්ටේ සංඝ සභාවේ මහනාහිමියන්ට වඩා අඩු සුදුසුකම් සහිත වයසින් අඩු අනුනාහිමිවරුන්ට මූලිකත්වය දී කටයුතු කරනු ලබන බව,

4. කෝට්ටේ සංඝ සභාවේ මහනායක අක්තපත්‍ර උත්සව හා ආදාහන පූජෝත්සව ඇතැම් රාජ්‍ය පාලන කාලවල රාජ්‍ය ගෞරව සහිතව සිදුකෙරෙන අතර ඇතැම් කාලවල එසේ අනුග්‍රහය දක්වනු නොලබන බව,

5. රජය මඟින් නිකාය මූලස්ථාන සඳහා ලබාදෙන මූල්‍ය ප්‍රතිපාදන ඉතා කලාතුරකින් පමණක් කෝට්ටේ සංඝ සභාව වෙත ලබා දෙන බව,

6. විදෙස් සංචාර ආදියට රාජ්‍ය නියෝජන නම් කිරීමේදී කෝට්ටේ සංඝ සභාවට කිසිදු අවස්ථාවක් නොලැබෙන බව,

7. අතිපූජ්‍ය මහනායක මාහිමිපාණන් වහන්සේලා වෙත රජය මඟින් ලබාදෙන ඉන්ධන දීමනා, තීරුබදු රහිත වාහන, ආරක්ෂක පහසුකම් හා සෞඛ්‍ය පහසුකම් කෝට්ටේ සංඝ සභාවේ මහනායක මාහිමිපාණන් වහන්සේට හිමි නොවන බව,

8. සංඝ සභාවේ කාර්යාලය නඩත්තු කිරීම සඳහා ස්ථිර ලිපිකරුවන් හා සුළු සේවකයන් කෝට්ටේ සංඝ සභාව වෙත ලබා දී නොමැති බව,

ජාතික උත්සව අවස්ථාවලදී ආසන පැනවීමේ දී පවතින අසමානතා සම්බන්ධව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් සඳහන් කරනු ලබන්නේ, ජාතික උත්සව අවස්ථාවලදී මහනායක ස්වාමීන්

වහන්සේලා, අනුනායක ස්වාමීන් වහන්සේලා, සංඝනායක ස්වාමීන් වහන්සේලා, විහාරාධිපති ස්වාමීන් වහන්සේලා ලෙස පිළිවෙලින් අසුන් පැනවීම සිදුකරන බවත් සෙසු භික්ෂූන් වහන්සේලා සඳහා වෙන්කර ඇති ආසන සහ මහළු පිළිවෙළ අනුව වඩා හිඳුවීම සිදුකරනු ලබන බවත් භික්ෂූන් වහන්සේලා සඳහා වෙනම ම සකසා ගත් ප්‍රමුඛතා ලේඛනයක් නොමැති බවත් ශාසනික සම්ප්‍රදාය අනුව එලෙස නිශ්චිත ලේඛනයක් සැකසීම ද ප්‍රායෝගිකව අපහසු වන බවත් ය. කෙසේ නමුත් කොටපිටියේ රාහුල අනුනාහිමි විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත කරුණු දැක්වීම අනුව රාජ්‍ය උත්සවවලදී අසුන් පැනවීමේදී සියම් නිකායේ මල්වතු, අස්ගිරි පාර්ශව සහ රාමඤ්ඤ, අමරපුර යන නිකායවල මහනායක ස්වාමීන් වහන්සේලා සඳහා ප්‍රධාන අසුන් පැනවෙන නමුත් විහාරස්ථාන 800කට වැඩි ප්‍රමාණයක් සතු කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ මහනාහිමියන්ට මල්වතු හා අස්ගිරි පාර්ශ්ව හා සමානව අසුන් පැනවීමක් සිදු නොවන බව නිරීක්ෂණය වේ.

නිකාය සඳහා රජය විසින් ලබාදෙන වරප්‍රසාද සහ පහසුකම් සමානව නොලැබීම සම්බන්ධව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් සඳහන් කරනු ලබන්නේ, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව වෙත වෙන්වන ප්‍රතිපාදන අතර නිකාය මූලස්ථාන සඳහා වාර්ෂිකව රු.240,000 ක රාජ්‍ය ප්‍රතිපාදන ලබාදීම සිදුකරනු ලබන බවත්, මේ සඳහා අවම වශයෙන් විහාරස්ථාන 600 කට වඩා ඇති නිකාය මූලස්ථාන තෝරා ගනු ලබන බවත්ය.

දැනට මෙම දීමනාව ලබා දෙන නිකාය මූලස්ථාන පහක් ඇති බව නිරීක්ෂණය වේ. ඒවා නම්,

- ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශවය
- ස්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශවය
- ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව
- ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාව
- ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය

කෙසේනමුත් කොටපිටියේ රාහුල අනුනාහිමිගේ කරුණු දැක්වීම හරහා නිරීක්ෂණය වන්නේ, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් සඳහන් කරන ආකාරයට කෝට්ටේ සංඝ සභාවට පසුගිය මාස 6 තුළ එවැනි මුදලක් හිමිව නොමැති බවත්, 2023.10.24 දින කොමිෂන් සභාව ඉදිරියේ පවත්වන ලද පරීක්ෂණයෙන් අනතුරුව අදාළ මුදල් ලබාදීමට කටයුතු කර ඇති බවත් ය.

තවද රජය විසින් වාර්ෂිකව ලබා දෙන රු.240,000 ක දීමනාව කෝට්ටේ සංඝ සභාවට ද ලබා දෙන බවට බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශ කර ඇති නමුත් ඒ බව සනාථ කළ හැකි ලිඛිත සාක්ෂි ඉදිරිපත්ව නොමැති බව නිරීක්ෂණය වේ.

1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතේ සංශෝධිත පනත් කෙටුම්පත බුද්ධශාසන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සියම් නිකායේ මල්වතු, අස්ගිරි පාර්ශව වෙත සහ රාමඤ්ඤ, අමරපුර නිකාය වෙත යවා ඇති නමුත් කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව වෙත යොමු කිරීමට කටයුතු නොකිරීම හරහා රාජ්‍ය කටයුතුවලදී සියම් නිකායේ අස්ගිරි හා මල්වතු පාර්ශවවල මහානාහිමිවරුන් දෙදෙනාගේ මතය පමණක් සියම් නිකාය වෙනුවෙන් විමසන බව තහවුරු වේ. තවද උක්ත පනත් කෙටුම්පත කෝට්ටේ සංඝ සභාව වෙත යොමු කරන ලෙස සිව් වතාවකදී ඉල්ලීම් කිරීමට සිදුවීම හරහා ද ඒ බව වඩාත් තහවුරු වේ.

එසේම මෙම කරුණු වලදී අදාළ ඉහළ බලධාරීන්ට අවශ්‍ය කරුණු පෙන්වා දෙමින් වඩාත් පුළුල් හා වගකීමකින් කටයුතු කළ යුතු වුවද බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව එම භූමිකාව නිසි පරිදි ක්‍රියාත්මක කර තිබේද යන්න ගැටළුවකි. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව විසින්ම ප්‍රකාශ කරනු ලබන ප්‍රතිපාදන දීම සඳහා පිළිගත් නිකාය මූලස්ථාන පහක් පවතින බව සඳහන් වේ. එයට කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්ම මහා සංඝ සභාවද ඇතුළත්ය. එහෙත් බෞද්ධ කටයුතු දොපර්තමේන්තුව හා රජය විසින් රාජ්‍ය අනුග්‍රාහකත්වයන් හා පිළිගැනීම් සිදුකිරීම, උපදෙස් ලබා ගැනීම, බෞද්ධ නිල මණ්ඩල වලට පත්කිරීම යනාදී කාරණා වලදී අනෙකුත් පිළිගත් නිකාය මූලස්ථාන හතරට දක්වන සැළකිලි හා සමානව කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම සංඝ සභාවට නොදැක්වීමෙන් වෙනස්කමකට ලක් කර ඇති බවට දක්වා ඇති කරුණු බැහැර කිරීමට ප්‍රමාණවත් කරුණු බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව විසින් හෝ අනෙකුත් වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය වේ. ඒ අනුව එය මහානායක හිමිවරුන්ගේ එකඟතාවය මත සිදුකළ යුතු කරුණක් බවට බෞද්ධ කටයුතු කොමසාරිස් දක්වන අදහස නිවැරදි නොවේ. මන්දයත් එය බෞද්ධ ශාසනය තුළ පවතින කරුණක් නොව රජය විසින් දෙනු ලබන පිළිගැනීම හා අනුග්‍රහය අසමානව සැලකීම පිළිබඳ කරුණක් වන නිසාය.

මෙහිදී ප්‍රධාන වශයෙන් කරුණු දෙකක් ඉදිරිපත් වේ.

I කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්ම සංඝ සභාව ඓතිහාසික කරුණු අනුව වෙන් වූ සංඝ සභාවක්ද,

II එකී සංඝ සභාව සියම් නිකායේ තවත් එක් පාර්ශවයක්ද යන්නයි

මෙම කරුණු පිළිබඳ නිගමනයක් කිරීමට කොමිෂන් සභාව අපේක්ෂා නොකරයි. කෙසේ වුවද කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සංඝ සභාව ස්වාධීන වෙනම ම සංඝ සභාවක් වුවද, නැතහොත් සියම් කිනායේ පාර්ශවයක් වුවද, රජය මඟින් දෙනු ලබන පිළිගැනීම,ප්‍රතිලාභ හා වරප්‍රසාද සඳහා එකී කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්ම සංඝ සභාවට හිමිකමක් පවතින බව හා අනෙකුත් ප්‍රධාන නිකාය මූලස්ථානවලින් වෙනස්ව නොසැළකිය යුතු බව පැහැදිලිව නිරීක්ෂණය වේ. එය රජය මඟින් විහාරස්ථාන 600 කට වඩා ඇති නිකාය මූලස්ථාන පහෙන් එකක් ලෙස පිළිගෙන තිබීම මඟින් ම එය වඩාත් තහවුරු වේ. එසේ තිබියදී එම සංඝ සභාවට රජය විසින්, රජය මඟින්ම පිළිගෙන ඇති නිකාය මූලස්ථාන පහ (5) අතරින් අනෙකුත් සංඝ සභාවලට දෙනු ලබන ප්‍රතිලාභ, වරප්‍රසාද හා පිළිගැනීම කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සංඝ සභාවට ලබා නොදීම තුළින් කොට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රීදර්ම මහා සංඝ සභාව වෙනස්කොට සැළකීමකට ලක්කොට ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරනු ලබයි.

**නිගමනය :-**

ඉහත නිරීක්ෂණවලට අනුව රජය මගින් අදාළ නිකාය සම්බන්ධව කරනු ලබන මැදිහත්වීම්වලදී, වරප්‍රසාද ලබාදීමේදී හා ප්‍රතිලාභ සැලසීමේදී ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවට සියම් නිකායේ මල්වතු හා අස්ගිරි පාර්ශව හා ප්‍රධාන මූලස්ථාන ලෙස රජය පිළිගෙන ඇති අනෙකුත් නිකාය මූලස්ථාන හා සමානව කටයුතු නොකිරීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය මගින් සුරක්ෂිත කර ඇති සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිගමනය වේ.

නිර්දේශය :-

ඉහත කරුණු අනුව, රජය විසින්ම පිළිගෙන ඇති නිකාය මූලස්ථාන 5 අතරින් අනෙකුත් නිකාය මූලස්ථානවලට රජය මගින් ලබාදෙනු ලබන ප්‍රතිලාභ හෝ උපදෙස් විමසීම් ආදියේදී කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමාග්‍රිධර්ම මහා සංඝ සභාවට එකී ප්‍රතිලාභ ලබාදීම හෝ උපදෙස් ගැනීම ආදී කටයුතු සිදු නොවන බව නිරීක්ෂණය වේ.

ඒ අනුව, සියම් නිකායේ අදහස් විමසනු ලබන අවස්ථා වලදී, මල්වතු අස්ගිරි පාර්ශව වල අදහස පමණක් නොව කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රිධර්ම මහා සංඝ සභාවේද අදහස් විමසා බැලීමට පියවර ගැනීමටත්, බුද්ධශාසනය පිළිබඳ අනුශාසක මණ්ඩලය පත් කිරීමේදී අනෙකුත් ප්‍රධාන සංඝ සභාවලට මෙන් කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රිධර්ම මහා සංඝ සභාවටද නියෝජනය ලබා දීමටත්, රාජ්‍ය උත්සවවලදී ආසන පැනවීමේදී මල්වතු හා අස්ගිරි පාර්ශව මෙන්ම කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රිධර්ම මහා සංඝ සභාවට ද සුදුසු අසුන් පැනවීමටත්, මහානායක අක්තපත්‍ර උත්සව හා ආදාහන පූජෝත්සව පැවැත්වීමේදී අනෙකුත් සංඝ සභාවලට ලබාදෙන අනුග්‍රහය එපරිදිම කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමාග්‍රිධර්ම මහා සංඝ සභාවටද ලබාදීමටත්, රජය මගින් පිළිගෙන ඇති නිකාය මූලස්ථාන සඳහා ලබාදෙන මූල්‍ය ප්‍රතිපාදන කෝට්ටේ සංඝ සභාවටද විධිමත්ව ලබා දීමටත්, විදේශ සංචාර ආදියට නම් කිරීමේදීත් අනෙකුත් පහසුකම් සැලසීමේදීත් අනෙකුත් සංඝ සභාවලට හිමිවන වරප්‍රසාද එපරිදිම කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රිධර්ම මහා සංඝ සභාවට ද ලබා දීම සඳහාත් වගඋත්තර පාර්ශවය පියවර ගත යුතුය.

2024.05.21 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- 01. විදුර වික්‍රමනායක මහතා,
අමාත්‍යතුමා, බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.

B/

02. මහලේකම් අනුනාහිමි,
කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහා සංඝ සභාව,
කෝට්ටේ රජමහා විහාරය,
කෝට්ටේ